සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය 2021 | පැය 02 යි |
| கண்டுபிடிப்பு சோதனை 2021 | 02 மணி நேரம் |
| Diagnostic Test 2021 | 02 Hours |
| සිංහල භාෂාව හා සාහිත්‍යය | 08 ශ්‍රේණිය |
| சிங்கள மொழி மற்றும் இலக்கியம் | தரம் 08 |
| Sinhala Language and Literature | Grade 08 |

විභාග අංකය ........................................................

**I** කොටස

- පළමුවන කොටසට අයත් සියලුම ප්‍රශ්න සඳහා මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු ලියන්න.
- I පත්‍රයට අදාළ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

01. අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තොරා යටින් ඉරක් අඳින්න.

i. සමස්ත ii. වාර්ථා iii. විශිෂ්ඨ iv. පුස්ථකාලය

02. අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තොරා යටින් ඉරක් අඳින්න.

i. ශ්‍රේනිය ii. විශේශණ iii. ප්‍රශ්ණ iv. විමර්ශන

03. රාත්‍රිය නැමැති පද්‍ය පන්තිය රචනා කළේ

i. මහගම සෙකර ii. ගුණදාස අමරසේකර iii. වැලිවිට සෝරත හිමි iv. ඇස්. මහින්ද හිමි

04. ප්‍රාදේශිය මහලේකම්. කළමනාකරු, ස්ථානාධිපති යන තනතුරු පිළිවෙළින් අයත් වන ආයතන වන්නේ

i. ලේකම් කාර්යාලය, බැංකුව, තැපැල් කාර්යාලය

ii. තැපැල් කාර්යාලය, බැංකුව, ලේකම් කාර්යාලය

iii. ලේකම් කාර්යාලය, තැපැල් කාර්යාලය, බැංකුව

iv. බැංකුව, තැපැල් කාර්යාලය, ලේකම් කාර්යාලය

05. ගුරු ශිෂ්‍ය සබඳතාව වඩාත් වැදගත් වන්නේ

i. පන්සලට ii. පාසලට iii. නිවසට iv. රෝහලට

06. සමාජ සම්බන්ධතාව අනුව ඥාති සම්බනධතාවක් ගැන නොකියවෙන්නේ

i. තාත්තා ii. මාමා iii. මහත්තයා iv. පුතා

**පහත සඳහන් අර්ථයට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරා යටින් ඉරක් අඳින්න.**

07. බොරු සෙනෙහසක් පෙන්වීම

i. කුකුළු නින්ද

ii. බක තපස් රැකීම

iii. කිඹුල් කඳුළු හෙළීම

iv. ජාඩියට මූඩිය වගේ

08. අකාරාදි පිළිවෙළට යෙදී ඇති වරණය තොරන්න.

i. කොළඹ, කඩවත, කතරගම, කෑගල්ල

ii. අමාවතුර, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, බුත්සරණ

iii. ඉංග්‍රීසි, සිංහල, ගණිතය, ඉතිහාසය

iv. කහපාට, නිල්පාට, රතුපාට, සුදුපාට

**පහත සඳහන් තනතුරු  නාමය අයත් වන රාජ්‍ය ආයතනයක් නොවන්නේ**

09. ස්ථානාධිපති තුමා

i. පොලිසිය ii. තැපැල් කන්තෝරුව iii. ලේකම් කාර්යාලය iv. දුම්රිය ස්ථානය

10. සභාපති තුමා

i. ඉංජිනේරු කාර්යාලය ii. ප්‍රාදේශීය සභාව

iii. මරණාධාර සමිතිය iv. පාසල් සංවර්ධන සමිතිය

**මුලින් දී ඇති බහු අර්ථ පදයට අයත් නොවන පදය තෝරා යටින් ඉරක් අඳින්න**

11. දදය - i. කොඩිය ii. කුෂ්ඨය iii. අඥාන iv. මුහුණ

12. සඳ - i. ඡත්‍රය ii. චන්ද්‍රයා iii. උතුම් iv. සන්ධිය

13. ගුණ නාම යන්නට උදාහරණයක් වන්නේ,

i. නරඹන ii. සාමාජික iii. නාගරික iv. මහලු

14. වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කර ගැනීමෙන් අනතුරුව පැවතියේ සාකච්ඡා වාරයයි.
සමිතියක වාර්තාව සභාවට ඉදිරිපත් කරනු ලබන්නේ,

i. සභාපති තුමා විසනි ii. භාණ්ඩාගාරික තුමා විසිනි

iii. ලේකම් තුමා විසිනි iv. සංවිධායක තුමා විසිනි

15. වැසි වසිනා අහස අපි යන ගීතය රචනා කළේ

i. ඩබ්.ඩී. අමරදේව මහතා ය.

ii. මහගමසේකර මහතා ය.

iii. ගුණදාස අමරසේකර මහතා ය.

iv. මාටින් වික්‍රමසිංහ මහතා ය.

16. ගී ගයන්නීය යන පදය

i. වර්තමාන පුරුෂ ලිංග පදයකි

ii. අනාගත ස්ත්‍රී ලිංග පදයකි

iii. වර්තමාන ස්ත්‍රී ලිංග පදයකි

iv. අතීත පුරුෂ ලිංග පදයකි

17. අපේ ගම නවකතාව රචනා කරන ලද්දේ

i. මාර්ටින් වික්‍රමසිංහ මහතා විසිනි

ii. ඩබ්. ඒ. සිල්වා මහතා විසිනි

iii. ගුණදාස අමරසේකර මහතා විසිනි

iv. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා

18. 'බරණැස් පුරයට යෙහෙන් පැමිණ දසරාජ ධර්මයෙන් රාජ්‍යය කරනු මැනවි', මෙහි කරනු මැනවි යන පදය

i. පූර්ව ක්‍රියාවකි

ii. මිශ්‍ර ක්‍රියාවකි

iii. විධි ක්‍රියාවකි

iv. ආශීර්වාද ක්‍රියාවකි

19. කලත්‍ර පරිග්‍රහය යන්නෙහි අර්ථය වන්නේ

i. ස්වාමි භාර්යා සබඳතා

ii. භාර්යාවක පාවා ගැනීම

iii. කාලයාගේ ඇවෑමෙන්

iv. ඉමහත් පරිශ්‍රමයෙන්

20. අනුක්ත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

i. නිලධාරීහු ii. ළමයෙකු iii. කාන්තාව iv. මම

(2×20=40)

## II කොටස

- 1 හා 2 ප්‍රශ්න ඇතුළත්වන සේ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. ඔබ පන්ති කාමරයේ සිදුකළ කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ඔබ ඉගෙන ගත් ප්‍රායෝගික ලේඛන වර්ග 02ක් නම් කරන්න.

II. ඒවායේ ඇති ප්‍රයෝජන 02ක් ලියන්න.

III. මෙම ක්‍රියාකාරකම් සිදු කිරීමේදී ගුරුතුමිය/ගුරුතුමා ලබා දුන් උපදෙස් 02ක් ලියන්න.

IV. ප්‍රායෝගික ලේඛනයක් ලෙස දැන්වීම් පත්‍රිකාවක් යොදා ගත හැකි අවස්ථා 02 ක් නම් කරන්න.

V. දැන්වීම් පත්‍රිකාවක ඇතුළත් විය යුතු ලක්ෂණ 03ක් ලියන්න.

(ලකුණු 15)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150ට නො අඩු රචනාවක් ලියන්න.

I. ළමා අයිතිවාසිකම් සුරකිමු.

II. ලෝකෙන් උතුම් රට ලංකාවයි.

III. මා කැමති ලේඛකයා

IV. සුන්දර රාත්‍රියක අසිරිය

නැතහොත්

V. සිරිමල් දක්ෂ දරුවෙකි. ඉගෙන ගැනීමට මෙන් ම ක්‍රීඩාව හා සංගීතයට ද පුදුම හපන්කම් පෙන්වයි. දුප්පත් පවුලක විවිධ අගහිඟකම් මැද උත්සාහයෙන් කටයුතු කරන ඔහු ජීවිතයේ අභියෝග ජය ගෙන කීර්තිමත් පුද්ගලයෙකු බවට පත් විය.......... මේ කොටස ඉවහල් කර ගෙන කතාවක් ගොඩනගන්න.

(ලකුණු 15)

03. (අ) "උඹේ මේ කෙහෙම්මල් හවරිය හන්දා මගේ හේනේ කුඹුරේ වැඩත් පාළු වුණා"

1. මෙම කොටස ඇතුළත් පාඩමේ නම ලියන්න.

2. මෙසේ ප්‍රකාශය කළේ කව්රුන් විසින් කාහටද?

(ආ) "ඉඳ ඉක්මනට කඩේට ගිහිල්ලා නූල් රෝල් දෙකක් අරගෙන වරෙන්"

1. මෙසේ ප්‍රකාශ කළේ කවු ද?

2. මෙම ප්‍රකාශය කළේ කාට ද?

(ඇ) "මගේ ගායනය වඩා මිහිරි වන්නේ මේ සුන්දර හරිත වන පෙත තුළයි"

1. මෙම පාඨය ඇතුළත් පාඩම ලියන්න.

2. මෙම පාඩම ඇතුළත් කතාව නම් කරන්න.

(ඈ) "ගොවියෝ අපි කම්කරුවෝ

රට රකිනා ජනතාවෝ"

1. ඉහත සඳහන් ගී ඛණ්ඩය ඇතුළත් ගීතය රචනා කළේ කවු ද?

2. එම ගීතය ගායනා කරන්නේ කවුරුන් විසින් ද?

(ඉ) "වැද්දන් ආපසු එති'යි මම නොසිතම් සොඳුර, එහෙත්, ආවත් ඔබට අනතුරක් වන්නට ඉඩ නොදෙමි"

1. මෙම පාඨය ඇතුළත් නාට්‍යය කුමක් ද?

2. මෙහි සොඳුර යන්නෙන් අමතන්නේ කාට ද?

(ලකුණු 10)

04. පහත වරහන් තුළ දී ඇති වචන **ජාති නාම, ද්‍රව්‍ය නාම, ගුණ නාම, සංඥා නාම** වශයෙන් වගු ගත කර බෙදා දක්වන්න.
(හංසයා, වැලි, ලංකාව, රටකජු, උස, කෙට්ටු, දිනමිණ, වතුර, පොත්, ඕලු ,මුගුණුවැන්න, ගල්, කරුණාවන්ත, දක්ෂ ,කුරුල්ලා, පැන්සල, මහලු, සම්පත් ,ගුත්තිලය, සබරගමුව)

(ලකුණු 10)

05. සුදුසු උක්ත පද හෝ ආඛ්‍යාත පද යොදා සම්පූර්ණ කරන්න.

1. ගොවියා සී සෑමට ගවයන් දක්කාගෙන ......................................
2. රජවරු ධාර්මිකව රට පාලනය .....................................
3. කුමාරතුංග මුනිදාස සූරිහු සාහිත්‍යයට මහ මෙහෙවරක් .......................................
4. .................................. පලතුරු අලෙවි කළාය.
5. ...................................... ගෘහ භාණ්ඩ සාදයි.
6. .................................. සරුංගලයක් සාදයි.
7. ...................................... ගීත නාද කළෝ ය.
8. තාරකාව අහසේ දීප්තිමත් ව ...........................................
9. තොපි පන්තිය පිරිසිදු ....................................
10. ..................................... මිතුරන්ට ලිපියක් ලියන්නෙමු.

(ලකුණු 10)

06. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දීඝලම්භික නම් නුවර වසන බමුණෝ දෙන්නෙක් ශාසනයෙන් පිටත මහණව අටසාළිස් අවුරුද්දක් තපස් කළෝ ය. උන් දෙන්නා ගෙන් එක් කෙනෙක් කලත්‍ර පරිග්‍රහය නැති කලට අපගේ කුල පරම්පරාව නසී'යි සිතා තමා රැකි තපස් අනුන්ට විකුට දෝ හෙවත් එහි පින් දී ගෙරි සියයකුත් පාද පරිචාරිකා කෙනෙකුන් ලදින් පුත්‍ර ප්‍රතිලාභය තකා කලත්‍ර පරිග්‍රහ කළෝ ය.

1. මේ දීඝායු කුමාරයාගේ කතා පුවත ඇතුළත් ග්‍රන්ථය නම් කරන්න.
2. පහත සඳහන් පදවල තේරුම ලියන්න.
   (අ) අටසාළිස් අවුරුද්දක්
   (ආ) පාද පරිචාරිකා
3. මෙම ඡේදයේ සඳහන් ලාභය කුමක් ද?
4. මෙහි සඳහන් 100 (සියය) ඒවා කීයද? ඒ මොනවා ද?
5. මහාප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වචන දෙකක් මෙම ඡේදයෙන් උපුටා දක්වන්න.